**කලාප අධ්‍යාපන කාර්යාලය - රත්නපුර**

**ව්‍යාපාර සංඛ්‍යානය - 13 ශ්‍රේණිය**

**ඒකක පරීක්ෂණය - 8.0 ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා සංඛ්‍යාන කල්පිත පරීක්ෂාව යොදා ගනියි.**

1. සංඛ්‍යාන කල්පිත පරීක්ෂා යන්න පැහැදිලි කරන්න.

2. පරීක්ෂා සංඛ්‍යාතිය හඳුන්වා එය ගණනය කරන ආකාරය පැහැදිලි කරන්න.

3. පහත අවස්ථා සඳහා කල්පිත ගොඩනගන්න.

    1. විදුලි බල්බ නිෂ්පාදන ආයතනයක නිපදවන විදුලි බල්බයක සාමාන්‍ය ආයු කාලය පැය 26 000 ව පැවතුණි. නව සූත්‍රිකා විශේෂයක් හඳුන්වා දුන් පසු ආයතනය නිපදවන විදුලි බුබුලක ආයු කාලය වැඩි වන බව නිෂ්පාදන ආයතනය ප්‍රකාශ කරයි.

    2. කිරිපිටි නිෂ්පාදන ආයතනයක නිපදවන කිරිපිටි 100 g ක අඩංගු මේදය ප්‍රමාණයේ මධ්‍යන්‍යය 12g ව පැවතුණි. නව තාක්ෂණය යොදා ගැනීම නිසා කිරිපිටිවල අඩංගු මේද ප්‍රමාණය අඩු වී ඇති බව නිෂ්පාදන සමාගම ප්‍රකාශ කරයි.

    3. එක්තරා ගොවිජනපදයක බොහෝ කාලයක සිට යල කන්නයේ දී හෙක්ටයාර එකකින් ලබන මධ්‍යන්‍ය වී අස්වැන්න 3 200 kg ලෙස අනාවරණය කර ගෙන ඇත. පසුගිය යළ කන්නයේ දී නව බිත්තර වී ප්‍රභේදයක් හා නව වගා ක්‍රම කිහිපයක් අත්හදා බලන ලදී. එම කන්නයේ එම ජනපදයේ ගොවි මහතකු සත්‍ය වශයෙන් හෙක්ටහාර් එකකට ලබා ගත් අස්වැන්නෙහි වෙසෙසි වෙනසක් සිදු වී ඇත්දැයි පරීක්ෂා කළ යුතු ව ඇත.

- නව ප්‍රචාරණ වැඩපිළිවෙළින් පසු සමාගමේ දෛනික සමාන්‍ය අලෙවිය පෙර පැවති දෛනික සාමාන්‍ය අලෙවිය වූ ඒකක 210 ඉක්මවා ඇතැයි කළමනාකරු සඳහන් කරයි.
- දින 36 ක නියැදියක් පරීක්ෂා කිරීමේ දී දිනක මධ්‍යන්‍ය අලෙවිය ඒකක 225 සහ සම්මත අපගමනය ඒකක 40ක් විය.
- 1% ක වෙසෙසි මට්ටමින් පරීක්ෂාවක් සිදු කර කළමනාකරුගේ අදහස පිළිගත හැකි ද යන්න පෙන්වා දෙන්න.

  පරීක්ෂාවේ P අගය ගණනය කරන්න.